**සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන අරමුදල - 2015**

----------------------------------------------------------------------------------------------------

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ .

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සමූපකාර සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 350,000 ක් වූ ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2** **පැහැදිලි නොකළ වෙනස්කම්**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමූපකාර සමිති ණය සහ ලැබිය යුතු ණය පොලි විෂයයන් 2ක එකතුව රු. 31,688,811 ක් වුවද උපලේඛන අනුව එම එකතුව රු.55,279,605 ක් වූයෙන් රු. 23,590,794 ක වෙනසක් පැවතුණි.

**2.2.3** **විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු. 54,828,396 ක් වූ සමූපකාර විදුහල් ණය, ලොරි රථ ණය, මානව සම්පත් සමූපකාර ණය, ලොරි රථ ආධාර සහ 2013 අතිරික්ත අරමුදලට ලබාදුන් තොගවලට අදාළ ණය ලිපිගොනු සහ ණය ගිවිසුම් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**2.3** **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු එකතුව රු.3,183,600 ක් වූ කාර්යසාධන අත්තිකාරම් හා උසාවි වන්දි වසර 7 ක් තිස්සේ අයකර ගෙන නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේ සිට ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු එකතුව රු 2,411,653 ක් වූ අගරු චෙක්පත් වලට අදාල ණයගැතියන් හදුනාගෙන එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රජයේ ගිණුමෙන් ලැබිය යුතු රු.180,394 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයවී නොතිබුණි.

**2.4** **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 188 (2) | 2011 හා 2012 වර්ෂයන්ට අදාළ එකතුව රු.300,000 ක් වූ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් 2016 සැප්තැම්බර් 30 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 | 2010, 2012, 2013 හා 2015 වර්ෂයන්ට අදාලව නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 සිට වසර 05 ඉක්මවූ එකතුව රු.54,964 ක් වූ චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| (i) 4.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ වාර්ෂික අයවැය ලේඛනය සඳහා අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 4.2 ඡේදය | අරමුදල් සඳහා වෙනම බැංකු ගිණුමක් සහ පොත්පත් පවත්වා ගෙන යන්නේ නම් එම ගිණුම් නිතිපතා සසඳා ප්‍රගතිය පිළිබඳ එක් එක් කාර්තුව සඳහා වූ වාර්තා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) 4.3 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ සමුච්චිත අරමුදලේ වෙනස්කම් දැක්වෙන ප්‍රකාශයක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,458,554 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,998,614 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 19,457,168 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම රු.9,821,993 කින් අඩුවී තිබූ නමුත් වෙනත් වියදම් රු.1,633,642 කින්, විදේශ ගමන් වියදම් රු.1,303,334 කින්, ප්‍රචාරණ

හා විකුණුම් වියදම් රු.8,339,365 කින් සහ ආධාර වියදම් රු.18,414,346 කින් අඩුවී තිබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2011 හා 2014 වර්ෂයන්හිදී ඌනතාවයක් පැවති අතර 2012, 2013 හා 2015 වර්ෂයන්හිදී මූල්‍ය අතිරික්තයක් පැවතුණි. කෙසේ වුවද, සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකීමේදී 2011 හා 2014 වර්ෂයන්හිදී දායකත්වය පිළිවෙලින් රු.155,473,139 ක් හා රු.10,636,877 ක සෘණ අගයක් පැවති අතර, 2012, 2013 හා 2015 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.31,949,148 ක් , රු.5,861,199 ක් හා රු. 8,899,693 ක ධන අගයක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

1974 ජනවාරි 10 දිනැති අංක 93/5 දරන ගැසට් නිවේදනය මඟින් පළ කරන ලද සමූපකාර රීතීන්හි 43 වගන්තිය ප්‍රකාර සමූපකාර අරමුදලෙහි මුදල් සමූපකාර අධ්‍යාපනය, ව්‍යාප්ති හා ප්‍රචාරක වැඩ, සමූපකාර සමිතිවල කළමනාකරණ කාර්යක්ෂමතා දියුණු කිරීම හා සමූපකාර සමිතිවලට උපකාර කිරීම සඳහා යෙදවිය හැකිවේ.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සී/ස කොබෙයිගනේ විවිධ සේවා සමූපකාර සමිතියට 2012 වර්ෂයේදී ලබා දුන් රු. 3,000,000 ක ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු. 2,983,090 ක ශේෂයක් හා හිඟ හිටි පොළිය රු. 630,900 ක් අයවී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලට අයවිය යුතු රු.10,542,980 ක අක්‍රීය ණය ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේදී අයවී තිබුණේ රු.55,414 ක් පමණි. එම අක්‍රීය ණය තුළ සමූපකාර සමිති 20 කට ලබාදී තිබුණු එකතුව රු. 8,270,900 ක ණය මුදල්වලින් කිසිදු මුදලක් අයවී නොතිබුණු අතර එම ණය මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

### 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ දී ජංගම ගිණුමේ රු.17,000,000 ක සාමාන්‍ය ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණු අතර අතිරික්ත මුදල් හඳුනාගෙන, එම මුදල් පොළී ආදායමක් ලැබෙන පරිදි ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010, 2011 හා 2012 සිට පැවත එන එකතුව රු. 141,522 ක් වූ හඳුනා නොගත් බැංකු බැර ශේෂ 05 ක් 2016 සැප්තැම්බර් 30 දින වන විටත් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේදී අර්තාපල් මිලදීගෙන දිවිනැඟුම ප්‍රතිලාභීන් වෙත නොමිලේ බෙදාහැරීම සඳහා චක්‍රීය අරමුදලින් රු.10,000,000 ක් ඌව පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් වෙත ලබාදී තිබුණි. මෙයින් මිලදී ගනු ලැබූ අර්තාපල් දිවයිනේ සියළුම දිවිනැඟුම ප්‍රතිලාභීන්ට කිලෝ ග්‍රෑම් 02 බැගින් බෙදාහැරීමට අරමුණු කර තිබුණද බෙදාහැර තිබුණේ වයඹ පළාත් දිවිනැඟුම ප්‍රතිලාභීන්ට පමණි. මෙහිදී සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශ ලේකම් හා දිවිනැඟුම දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් අතර පැවති එකඟතාවය මත මෙම මුදල් ලබා දී තිබුණු නමුත් ඒ සඳහා ලිඛිත ගිවිසුමක් නොතිබුණි. මෙම මුදල් 2016

අගෝස්තු 31 දින දක්වා අරමුදල වෙත ප්‍රතිපූරණය වී නොතිබුණු අතර ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් දන්වා තිබුණේ එම මුදල් ප්‍රතිපූරණය කළ නොහැකි බවයි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ගතවීමට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2016 මැයි 02 වන දින දීය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර්වරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | උපයෝගී පොත් යාවත්කාලීන නොකිරීම. |
| (ආ) | වත්කම් පරිපාලනය | නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ නොපැවැත්වීම. |
| (ඇ) | මූල්‍ය පාලනය | (i) සමූපකාර සමිතිවලින් ණය අයකර ගැනීමේ ප්‍රමාදය හා පසුවිපරම් කටයුතු නිසි පරිදි සිදු නොවීම. |
| | | (ii) අතිරික්ත මුදල් ආයෝජනය නොකිරීම. |